# කවි පොත් යුගයේ මතක සටහන්

එවකට අනුරපුරයේ ගම්මානවල, ගැමියන්, බණ පොත්, පංසල හා දැඩි බැඳීමක් පැවතුණි. වාර්ෂිකව පවත්වන බණ පිංකම්වලදී දොරකඩ අස්න, ආලවක දමනය, සච්චක දමනය ආදී, දෙබස් රංගමය ආකාරයෙන් ධර්ම දේශන ද ඒ අතර විය. මීට අමතරව කවි බණවලට විශේෂ ලැදියාවක් දැක්වූහ. මේ හැර ගුත්තිලය, බුදු ගුණ අලංකාරය, යසෝදරාවත, වෙස්සන්තර ජාතකය යන කවි පොත් ද භාවිතයේ පැවතිණ.

කොළඹ යුගයේ කවීන්ගේ, කවි කරණයට පෙර, කවි කොළ පිටු 10 දක්වා සැකසූ කුඩා කවි පොත් තිබී ඇත. රජරට එවකට සත 2 ට සත 3 ට අලෙවි වුනු පොත් ද තිබුණි. කොළඹ යුගයේ කිවි බී. එච්. අමරසේකරයන්, යසෝදරාවත, සැවැත් සුන්දරී වැනි කවි පොත් පිටවීමට පෙර, ගැමියන් අතරට සැකසූ කවි පොත් රාශියක් නිකුත් වී ඇත. ජාතක කතා කීපයක්ද විය. ඒ අතරින් සද්ධන්ත ජාතකය, එදා බෙහෙවින් ජනප්‍රිය විය. ''වෙස්සන්තර සිරිත'' කවි පොතද නිතර භාවිතයට ගැණින. මෙම පොත සමුද්‍ර ඝෝෂ විරිත කවි ආරෙන්, රසබර විරිත් රැසකින් ලියැවී තිබුණි. ''කාබෙරි කතාව'' ''අන්ද මව් තුන්දෙනාගේ කථාව'' ''ලියානෝරා කුමාරිගේ රසබර කතාව'' වැනි දීර්ඝ කතාන්දර ජනප්‍රිය වී තිබුණි. කීර්තිලතා මහත්මියද කවි පොත් රාශියක් ලියා ඇත.

වැඩිහිටියන් පැල් රැකීමට ගියපසු, ගමේ ඉතිරිවන අත්තම්මලා, අත්තප්පලා මෙවන් කවි පොත් දරුවන් ලවා හඬ නගා කියවා ගනු ලැබීය. ඒ අනුසාරයෙන් අසා කතාවක් සේ අන් අයට පැවසීමටද පුරුද ව සිටියහ. මේ එවන් වූ කවියකි.

*වනේ කැක්කුමට ගවයා තැවෙන* වර
*මසට ලොබින් කපුවෙකු පැන කොටන* යුර
*සැමියා මළ දුකින් දුක්වන මට මෙ* වර
*කුමන සැප පතා කරනෙම් ද කර* දර

මෙම කවිය කීර්තිලතා නම් වූ කිවිඳිය අතින් ලියූ පොතකින් උපුටා ගත් කවියෙකැයි මව්වරුන් අතර ප්‍රකට විය. ''මුතු කුමාරි'' හා ''ලියනෝරා කුමාරිගෙ'' කතා වල චරිත බටහිර නම්වලින් යුක්තය. ''අස්නේසන්,'' ''මතුමාරි'' කතාවේ චරිතයක් වූ අතර ''ලියනෝරිස්'' කතාවේ ලියනෝරා නැමැති කුමරි චරිතය විය.

නුවර කලාපයෙන්ද බිහි වූ කවිපොත් කීපයක්ම ඇත. 'අෂ්ඨනාරී-සංදේසය'' ඉන් විශේෂ වූ කවි පොතකි. තිස්පනේ සාගත ඇත් වූ කාලයේදී, ලියැවුනු ''සාගත කවි'' ''රට සාය'' හී පද ආදී වූ කවි පොත් ද ජනප්‍රිය වී ඇත. දෙපිළට බෙදී තලගොයි මැරීමට මුල්කරගෙන නුවර කලාවියේ බිහිවුනු කවි විශේෂයක්ද තිබී ඇත.

අපේ බෞද්ධ සාහිත්‍ය ඇසුරෙන්, පුරාණ රජ දවස ලියැවුණු කවි හා කොළඹ යුගයේ බිහිවුණු කවිවලට අතර මැදි යුගයේ ගැමි පද්‍ය සාහත්‍යයක් පැවති බවට සාක්ෂි දරයි.

මුද්‍රණ තාක්ෂණය දියුණුවීමෙන් හා මුද්‍රණ කඩදාසි බහුල වීමෙන්, මේ කවි පොත් සාහිත්‍යය ඇරඹී ඇති බව පෙනී යයි. එදා පැල් කවි හා ජන කවි වෙනස් අයුරින් ගායනා කරමින්, වෙලේ, හේනේ පැල් රැකි ගැමියා සීඝ්‍රයෙන් මේ කවි පොත්වලට යොමු වී ඇති බව පෙනේ.

ලන්තෑරුම දල්වා පැලේ උඩකින් එල්ලා, එම එලියෙන් තාලයට මේ කවි පොත්වල කවි ගායනා කිරීම එකල බහුලව පැවති සිරිතකි. එම යුගයේ කඩදාසි කොළ වල මුද්‍රණය කළ එබඳු කවි කොළ ගමට ව්‍යාප්තවීමක් සමගම, පැල් කවිය අභිබවා මේ කවි පොත් අතිශයින් ජනාදරයට පත් වී ඇත.

මෑත අතීතයේ ජන සාහිත්‍යයට ඇඳුනු මෙබඳු කවි පොත්, අද වන විට සීඝ්‍රයෙන් ජනතාව වෙතින් බැහැරව පවතින අතර, එම කවි පොත්, යුගයේ මතක සටහන් නම් පහසුවෙන් බැහැර කළ නොහැක. බී. එච්. අමරසේනයන් බෞද්ධ සාහිත්‍යයේ සුවිශේෂ චරිත කවියට නැගීමට පෙරද, ඒ ආසන්න කාලයකදී කවි පොත් ලියූ කවිකාරයන් රැසක් සිටි බවද පෙනේ.

ඇල්ෆ්‍රඩ් වටපුළුව
බ්‍රිස්බෙන්

# කලු ගඟ හැරෙයි

කලු ගඟ අසළ මහා උත්සවයකට පෙරළෙයි. කලු ගඟ හැරවීමේ උළෙල ඇරඹෙයි. වෙඩි හඬ මැද්දේ ගරු ජනාධිපතිතුමා පැමිණෙයි. මැති ඇමතිවරු ජයට පෙරහැරේ පැමිණෙයි. රටවල්වල නායකයෝ පැමිණෙන්නේ පසුවය. නායක ස්වාමීන් වහන්සේලා ගාම්භීරව වඩිනු සේක්ය. ඉන්දියාවෙන් විශේෂ නියෝජිතයෙක් පැමිණෙන්නේය. ගරු ජනාධිපති හරසරින් පිළිගැනීමට සියල්ල සූදානම්ය. උඩරට, පහතරට නැටුම් ගැයුම් වලින් ද සභාව රසවත් කලේය. පාසල් ළමුන්ගේ නැටුම් හා රසවත් ගීත කාගේත් සිත් ගත්තේය. මුළු පෙදෙසම අලංකාර ලෙස සරසා තිබුණෝය. උත්සවයට ඇතුලු වීමට බැරිතරම් ජනකායක් පිරී තිබුණෝය. රට ඉතා ඉක්මනින් සංවර්ධනය කිරීමත් ස්වයංපෝෂිත කිරීමත් ඉතාම ළඟ බව ප්‍රකාශ කලේය. එවිට සභාවෙන් විශාල අප්පුඩි හඬක් සහ ඔල්වරසන් ද නැගෙන්නට විය.

පසුව ඇවිදින් සිටි අනිකුත් නායකයෝ සහ ඇමතිවරු කෙටියෙන් කතා පවත්වන්නට විය. නායක ස්වාමීන් වහන්සේලා කෙටි කථා පැවැත්වූ සේක. බෞද්ධ, ක්‍රිස්තියානි, මුස්ලිම් පූජකවරු ආශිර්වාද කළ සේක. ගොවි මහතුන් විශාල පිරිසක් මෙම අවස්ථාවට සහභාගි විය.

අවසානයේ දී කොළඹ දක්වා යන මිනිසුන්ට බස් ධාවනයක් යෙදීමට කටයුතු කළේය.

බෙනඩික් පෙරේරා
හැම්ප්ටන් පාර්ක්